ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1998 අංක 30 දරන ඉස්ලාමීය මාර්ගෝපදේශ මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 ජුනි මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජුනි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.75 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

**1998 අංක 30 දරන ඉස්ලාමීය මාර්ගෝපදේශ මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1998 ජූනි මස 4 වන දින]

එල්.ඩී.—ඕ. 11/94.

**ඉස්ලාමීය මාර්ගෝපදේශ මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ඉස්ලාමීය මාර්ගෝපදේශ මධ්‍යස්ථානය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන මධ්‍යස්ථානයක් එකී මධ්‍යස්ථානයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී මධ්‍යස්ථානයේ පරමාර්ථ සහ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්ය සඳහා කාත්තන්කුඩි හි පිහිටුවා තිබූ හෙයින් ද, පූර්විකාව.

එකී මධ්‍යස්ථානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී මධ්‍යස්ථානය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එම මධ්‍යස්ථානය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම්කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම යෝග්‍ය සහ මහජන යහපත පිණිස වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මෙම පනත 1998 අංක 30 දරන, ඉස්ලාමීය මාර්ගෝපදේශ මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙම පනත ආරම්භවීමේ දින සිට සහ ඉන් පසු මෙහි මින් මතු "මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන ඉස්ලාමීය මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ සාමාජිකයන් වන්නා වූ තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් "ඉස්ලාමීය මාර්ගෝපදේශ මධ්‍යස්ථානය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහිත (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන්නේ ය. තවද, ඒ සංස්ථාව විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරිය හැකි හා නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ හා තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ඉස්ලාමීය මාර්ගෝපදේශ මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම.

2—D 036766–5,900(97/09)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) නිවැරදි ඉස්ලාමීය ශික්ෂාවන්ට අනුව ස්වකීය ආධ්‍යාත්මික හා ලෞකික ජීවිත ගත කිරීමේ හා පවත්වාගෙන යාමෙහි ලා මුස්ලිම් ජනතාව සූදානම් කිරීම හා ඔවුන්ට මග පෙන්වීම ;

(ආ) ශුද්ධ වූ කුරානයේ සහ ශුද්ධ වූ මුහම්මද් නබිතුමාණන්ගේ ඉගැන්වීම (සල්) චාරිත්‍ර, චාරිත්‍ර චාරිත්‍ර ප්‍රචාරය කිරීම :

(ඇ) සම්මන්ත්‍රණ, සම්මේලන හා සාකච්ඡා මුළු පැවැත්වීමෙන් විවිධ ආගමික ප්‍රජා අතර අවබෝධය හා මිත්‍රත්වය වර්ධනය කිරීම :

(ඈ) මුස්ලිම් ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනික අභිවෘද්ධිය සඳහා සහාය සැලසීම :

(ඉ) අරාබි භාෂාව ඉගෙන ගැනීම ධෛර්යමත් කිරීම :

(ඊ) මුස්ලිම් ජනතාව අතර කියැවීමේ ගුණාංගය වැඩිදියුණු කිරීම සඳහා ගම් මට්ටමින් පුස්තකාල පිහිටුවීම :

(උ) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි සිටින මුස්ලිම් ජනතාව පිළිබඳ දත්ත එකතු කිරීමට සහ ඒවා ආරක්ෂා කිරීමට කාර්යාලයක් පිහිටුවීම :

(ඌ) ආගමික කටයුතු හා පිළිවෙත් සම්බන්ධ වැඩ කටයුතුවල වැඩි කාර්යභාරයක් ඉටු කිරීමට මුස්ලිම් ජාතික කාන්තාවන් ධෛර්යමත් කිරීම :

(එ) මේ පනතේ පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් සාක්ෂාත් කරගැනීමට ආනුෂංගික වූ සහ හිතකර වූ ද මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනානුකූල නොවන්නා වූ ද සියලු ක්‍රියා හා දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. (1) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීමට අවශ්‍ය වන හිතකර වන හෝ ආනුෂංගික වන සියලුම දේ, සිදු කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියෙන් සංස්ථාව වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන බලතල සංස්ථාව සතු වන්නේ ය :—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන්, මුදලින් හෝ අන්‍යාකාරයකින් ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග, සහනාධාර සහ දායක මුදල් භාර ගැනීම හෝ එකතු කිරීම ;

(ආ) බැංකු ගිණුම් ඇරඹීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම සහ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඇ) සංස්ථාව සතුව ඇති හෝ සංස්ථාවට අයත් හෝ අරමුදල්, යෝග්‍ය සුරැකුම්පත්වල හෝ සංස්ථාවේ කාර්යය සඳහා සුදුසු නැතහොත් අවශ්‍ය වන චංචල හෝ නිශ්චල දේපළ මිලට ගැනීම හෝ අත්කර ගැනීම සඳහා ආයෝජනය කිරීම ;

(ඈ) සංස්ථාවට අයත් හෝ සංස්ථාව විසින් දරනු ලබන හෝ යම් ඉඩමක, යම් ගොඩනැගිල්ලක් නැතහොත් ව්‍යුහයක් ඉදිකිරීම හෝ ඉදිකිරීමට සැලැස්වීම.

5. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාවේ සභාපති, ප්‍රධාන ලේකම්, පරිපාලන ලේකම්, භාණ්ඩාගාරික හා ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන තවත් සාමාජිකයන් තුන්දෙනකුගෙන් සමන්විත කළමණාකරණ කමිටුවක් මගින්, පරිපාලනය කළ යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට ඉහතින් ම වූ දිනයේ දී මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුවේ ධුර දරනු ලැබුවා වූ ද මේ පනතේ උපලේඛනයෙහි නම් සඳහන් වන්නා වූ ද තැනැත්තන්ගෙන් සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුව සමන්විත විය යුතු ය.

6. (1) සාමාජිකයන් බඳවා ගැනීම, සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් නෙරපීම සඳහා ද කළමනාකරණ කමිටුවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටුකිරීම සම්බන්ධයෙන් ද කළමනාකරණ කමිටුවේ රැස්වීම් වල කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු සංස්ථාවේ රීති.

කාර්ය පටිපාටිය සඳහා සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම හා සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා ද සංස්ථාවේ සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඒ රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ රීති, එවැනිම රැස්වීමක දී ඒ හා සමාන ආකාරයෙන් ම වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම හෝ ඒවා සංශෝධනය කිරීම නැතහොත් ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට ඉහතින් ම වූ දිනයේ දී බලපැවැත් වූ මධ්‍යස්ථානයේ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සියලු සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

මධ්‍යස්ථානය විසින් ගෙවිය යුතු සහ මධ්‍යස්ථානයට අය විය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනයට ඉහතින් ම වූ දිනයේ දී පැවති මධ්‍යස්ථානයේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට මධ්‍යස්ථානයට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හා සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

8. සංස්ථාවේ සභාපති, ප්‍රධාන ලේකම් හෝ පරිපාලන ලේකම් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී සභාපති, ප්‍රධාන ලේකම් හෝ පරිපාලන ලේකම් තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරීම සහ බැහැර කිරීම කළ හැකි බව.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ පැවරීමක් ප්‍රකාර හෝ අන්‍ය ආකාරයකින් සංස්ථාව සතු විය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් සංස්ථාව විසින් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට

යටත්ව අත්කර ගැනීමට හා දැරීමට සංස්ථාවට බලය හා හැකියාව ඇත්තේ ය. තවද, ඒ සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන් කෙරෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය 5(2) වගන්තිය

කළමනාකරණ කමිටුව

සභාපති : මවුලවි ඒ. එම්. අලියාර් (බී.ඒ.)

ප්‍රධාන ලේකම් : අෂ්ෂේක් එස්. එස්. සෙයිඩ් අලාවි (බී.ඒ)

පරිපාලන ලේකම් : එස්. එස්. එම්. අන්සාර් මයා (බී.ඒ.)

භාණ්ඩාගාරික : මවුලවි හජීස් එම්. ඒ කලයිඩීන්

සෙසු සමාජිකයෝ : මවුලවි ඉසෙඩ් ඒ. හකිමුල් අමීන්
මවුලවි එම්. අයි. එම්. ඉර්ෂාඩ්
මවුලවි එම්. එම්. කතුබුර් රාහිම්.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.